# මාතෘ මරණ පිළිබඳ රහස්‍ය විමර්ශනය

## රහස්‍ය තොරතුරු ආකෘතිය

## සෙද නිලධාරී

**මාතෘ මරණ හඳුනාගැනීමේ අංකය: ..............................................(<u>අනිවාර්යයෙන්ම පිරවිය යුතුයි)</u>**
(රෝහල් අධ්‍යක්ෂවරයා වෙත යවන ලද මාතෘ මරණ දැනුම්දීමේ ලිපියක් මගින් FHB- MMMSU විසින් නිකුත් කරන ලදී)

ආයතන වර්ගය: NH/ TH/Maternity Hospital /DGH/ PDG/ BH/ DH/ Pvt

**කරුණාකර පහත උපදෙස් කියවන්න**

- ආයතන ප්‍රධානි/ වෛද්‍ය නිළධාරී සැලසුම්/ප්‍රජා සෞඛ්‍ය/ අදාළ වෛද්‍ය නිළධාරී වෙත නිකුත් කරන ලද මාතෘ මරණ අනන්‍යතා අංකය නිවැරදිව පුරවන්න.
- කරුණාකර මෙය අන් අය සමග සාකච්ඡා නොකර තනි තනිව පුරවන්න.
- මෙය විවිධ අවස්ථාවන් සඳහා නිර්මාණය කරන ලද පොදු ආකෘතියකි. ඔබ විසින් සපයනු ලැබූ සියලු සායනික සේවා තොරතුරු නිවැරදිව ලබා දෙනු ඇතැයි අපේක්ෂා කරනු ලැබේ.
- ඔබගේ පුද්ගලික හඳුනාගැනීමේ තොරතුරු (නම වැනි) මෙම ආකෘතියට ඇතුළත් නොකළ යුතුය.
- CEMD ක්‍රියාවලිය පුරාවටම ඔබගේ අනන්‍යතාවය සුරක්ෂිතව පවතිනු ඇත.
- ඔබ සපයන තොරතුරු රහසිගත වන අතර සමාලෝචන ක්‍රියාවලිය සඳහා පමණක් භාවිතා කරනු ඇත.
- මෙම තොරතුරු කිසිදු අවස්ථාවක විනය ක්‍රියාවලියකට සම්බන්ධ නොවේ.
- ඔබගේ අවංක අදහස සහ නිවැරදි තොරතුරු CEMD ක්‍රියාවලිය සඳහා අවශ්‍ය වේ. එබැවින්, මෙම රෝගියාට ලබා දුන් සත්කාරය හා සේවාවන් පිළිබඳව ඔබට හැඟෙන දේ සඳහන් කරන ලෙස ඉල්ලා සිටිමු.
- ඔබ සපයන අවංක තොරතුරු CEMD ක්‍රියාවලියේ පදනම වනු ඇති අතර, එය ජාතික මට්ටමේ නිර්දේශවල ගුණාත්මකභාවය ඉහළ නංවමින්, මාතෘ මරණ අවම කිරීම සඳහා වන ඉදිරි කටයුතුවලදී අපව නිවැරදි මාර්ගයට යොමු කරනු ඇත.
- ඔබ සපයන තොරතුරු නිර්නාමික බැවින්, එය කිසිදු නිශ්චිත පුද්ගලයෙකුට හෝ ආයතනයකට එරෙහිව භාවිතා නොකරනු ඇත

කරුණාකර, ඔබ මාතෘ මරණ අනන්‍යතා අංකය පළමු පිටුවෙහි නිවැරදිව සඳහන් කරන ලදදැයි නැවත පරික්ෂා කර බලන්න.

**1. මෙම රෝගියාට ඔබ සත්කාර ලබා දුන් අවස්ථා සඳහන් කරන්න.***(උදාහරණ: ඇතුළත් කිරීමේ දී, වාට්ටුවේ දී, ප්‍රසූතිකාමරයේ දී, සැත්කම් කාමරයේ දී (OT), සුවය ලබන අවස්ථාවේ දී, ප්‍රසූතියෙන් පසු වාට්ටුවේ දී, ආදී වශයෙන්)*

**2. රෝගියාට ලැබුණු සමස්ත සත්කාරය පිළිබඳව ඔබගේ පොදු අදහස කුමක්ද?** *(රෝගියාට ලැබුණු සත්කාරය පිළිබඳව ඔබට හැඟුණු දේ කෙටියෙන් විස්තර කරන්න. උදාහරණ: රෝගියාට අදාළව, සත්කාර සැපයීම/ සෞඛ්‍ය පද්ධතිය හා සම්බන්ධ සාධක )*

**3. සත්කාර හෝ සේවා සැපයීමේදී ඔබට කිසියම් අපහසුතාවක් / බාධාවක් / සීමාවක් / අභියෝගයක් / මග හැරුණු අවස්ථාවක් තිබූ බව ඔබ සිතනවාද?** *(පහත ක්ෂේත්‍ර සම්බන්ධයෙන් කෙටියෙන් විස්තර කරන්න.)*

• උපකරණ හා සැපයුම් (Equipments and reagents)

• කාර්ය මණ්ඩලය (ප්‍රමාණවත් කාර්ය මණ්ඩලයක් නොමැතිවීම, දරාගත නොහැකි ලෙස වැඩ අධික වීම)

• කාර්ය මණ්ඩලය / රෝගියා අතර සන්නිවේදනය (සත්කාර සපයන්නන් සම්බන්ධ කර ගැනීමට නොහැකිවීම / භාෂා ගැටලු ආදිය)

• සහායක සේවා (පරීක්ෂණාගාර, විකිරණ, ස්කෑන් සහ අනෙකුත් පරීක්ෂණ , ප්‍රවාහනය)

• ජ්‍යෂ්ඨ නිළධාරීන්ගේ මැදිහත්වීම (ඉහළ මට්ටමේ වෘත්තිකයෙකු වෙත යොමු නොකිරීම / ජ්‍යෂ්ඨ නිළධාරීන්ට දැනුම් නොදීම, ජ්‍යෂ්ඨ නිළධාරීන් ප්‍රතිචාර නොදැක්වීම, රෝගියා වෙත පැමිණීයේ නම් වාසිදායක විය හැකි වූ අයුරු)

• බහු-විධ විශේෂඥ සේවා (Multi Disciplinary Team – MDT) සම්බන්ධීකරණය (සම්බන්ධීකරණයේ දුෂ්කරතා, ජ්‍යෂ්ඨ මට්ටමේ මැදිහත්වීමක් නොමැතිවීම)

**4.** **ඔබගේ අදහස අනුව, අනාගතයේදී මෙවැනි මාතෘ මරණයක් වළක්වා ගැනීමට ඔබ වෙනත් ආකාරයකට කටයුතු කරන්නේ නම් ඒ කෙසේද?**

**5.** **මෙවැනි මරණයක් වැළක්වීම සඳහා රෝගියාගේ සමස්ත සත්කාර සේවාවන් (Overall management) වැඩිදියුණු කිරීමට ඔබගේ යෝජනා මොනවා ද?**

*(ඔබ විසින්ම / වෙනත් පුද්ගලයෙකු විසින් / ඔබගේ කණ්ඩායම විසින් / රෝහල් පරිපාලනය විසින් / සෞඛ්‍ය අමාත්‍යාංශය විසින්)*

***අනාගතයේදී මාතෘ සත්කාර වැඩිදියුණු කිරීම සඳහා ඔබ ලබා දුන් දායකත්වයට බෙහෙවින් ස්තුතියි.***